" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
සාමාන්‍ය දුරකථන / பொதுவான இலக்கம் / General Telephone 011 - 2093000

ISO 9001 · SLAB ACCREDITED · ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/18-38/FI/05-2022 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2022.10.10 |
|---|---|---|---|---|---|

පාලන චක්‍රලේඛ : **09/2022(I)**

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය(බ.ප.),
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප.),
ලේකම්,රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්,ආදායම් දෙපාර්තමේන්තුව(බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන නීති නිලධාරී,නීති ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරී,

**ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධාරීන්ට දේශීය / විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම.**

උක්ත ශීර්ෂය යටතේ 2022.08.03 දාතමින් යොමු කරන ලද පාලන චක්‍රලේඛ 09/2022 චක්‍රලේඛය හා සම්බන්ධවයි.

02. එම චක්‍රලේඛයට විෂයගත වන රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි ලේකම් විසින් 2022.06.22 දිනෙන් යුතුව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 දරණ චක්‍රලේඛයට අදාළව, 2022.09.06 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022(I) චක්‍රලේඛය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයට අදාළ කර ගැනීමට 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වගන්තිය යටතේ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලබා දෙන ලදි.

03. ඒ අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022(I) යටතේ සඳහන් උපදෙස් පහත විශේෂයෙන් සඳහන් කරන කරුණුවලට යටත්ව එලෙසින්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතු බව දන්වමි.

04. එනම් අදාළ චක්‍රලේඛයෙහි 03 වන ඡේදය යටතේ සඳහන් ආයතන සංග්‍රහයෙහි XII වැනි පරිච්ඡේදයේ 16 වගන්තිය යන්න සමග බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කාර්යය පරිපාටි රීති සංග්‍රහයේ විධිවිධාන යන්න ද අදාළ විය යුතුය. එසේම 14/2022(I) චක්‍රලේඛයෙහි සඳහන් අමාත්‍යාංශ ලේකම් යන්නට බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්, බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, බස්නාහිර පළාත් සභා ලේකම් යන්න ආදේශ විය යුතුය.

05. තවද මෙම කරුණට අදාළව පාලන චක්‍රලේඛ 09/2022 සමග යොමු ඇති ගිවිසුම් ආකෘතිය වෙනුවට මේ සමග ඉදිරිපත් කරනු ලබන ගිවිසුම් ආකෘතිය පරිදි නිවාඩු අනුමත කරනු ලබන බලධාරීත්වය සහ නිවාඩු ඉල්ලුම්කරු ගිවිසුම් ගත විය යුතු බව ද වැඩිදුරටත් දන්වමි.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதம செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුදල / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதம உள்ளகக் கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606<br>Fax : 0112092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631<br>Fax : 0112092647<br>dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640<br>Fax : 0112092636<br>dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532<br>Fax : 0112092533<br>dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501<br>Fax : 0112092505<br>dcs@eng.wpc.gov.lk | Tel : 0112092628<br>Fax : 0112092625<br>cia@cs.wpc.gov.lk |

<u>ගිවිසුමයි.</u>

මෙහි පහත ඇතැම් තැනක "පළමු පාර්ශවය" ලෙස හඳුන්වනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ ..............................................................(ප්‍රධාන ලේකම්/අමාත්‍යාංශයේ ලේකම්) වන ............................................ යන අය (අනුප්‍රාප්තිකව එම තනතුරට ස්ථිරව හෝ වැඩ බැලීම සඳහා පත්වන අයද සමග) එක් පක්ෂයකට ද, මෙහි ඇතැම් තැනක "දෙවන පාර්ශවය" ලෙස හඳුන්වනු ලබන .................................................. (අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ නම) සේවය කරන බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ........................................................................................................ තනතුරක් දරන ........................................................................................................................................යන ලිපිනය ඇති ............................................ යන අය අනෙක් පාර්ශවය වශයෙන්ද ඇති කරගන්නට යෙදෙන ගිවිසුමයි.

ඉහත කී දෙවන පාර්ශවය විසින් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කළ 2022.09.06 දිනැති අංක 14/2022(I) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි හා එමගින් සංශෝධිත 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 දරණ චක්‍රලේඛයෙහි විධිවිධාන ප්‍රකාරව ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොමැතිව විදේශීය වැටුප් රහිත නිවාඩු පළමු පාර්ශවය වෙතින් ඉල්ලුම් කිරීමට අපේක්ෂා කර ඇති හෙයින්ද, එකී පළමු පාර්ශවය වෙතින් ඉහත කී 2022.09.06 දිනැති අංක 14/2022(I) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි හා එමගින් සංශෝධිත 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 දරණ චක්‍රලේඛයෙහි විධිවිධානයන්ට අනුකූලව කරනු ලබන ඉල්ලීමකදී ඊට අදාළව ඉල්ලුම්කරුගේ ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි වැටුප් රහිත නිවාඩු ලබා දීමට පළමු පාර්ශවය එකඟ වන හෙයින්ද, විදේශ නිවාඩු කාල සීමාව තුළ ඉහත කී 2022.09.06 දිනැති අංක 14/2022(I) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි හා එමගින් සංශෝධිත 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 දරණ චක්‍රලේඛයෙහි විධිවිධානයන්ට අනුකූලව දෙපාර්ශවය අතර කටයුතු පවත්වාගෙන යාම පිළිබඳව එකී දෙපාර්ශවය විසින් පහත කොන්දේසි සහ බැඳීම්වලට යටත්ව මෙම ගිවිසුමට ඇතුළත් වේ.

ඉහත කී කොන්දේසි සහ බැඳීම් කවරේද යත්;

1. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කළ 2022.09.06 දිනැති අංක 14/2022(I) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි හා එමගින් සංශෝධිත 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 දරණ චක්‍රලේඛයෙහි විධිවිධාන (මෙහි මින් මතු රා.ප.ච.අංක 14/2022(I) හා එමගින් සංශෝධිත රා.ප.ච.අංක 14/2022 යනුවෙන් හඳුන්වන) මෙම ගිවිසුමෙහි කොටසක් වශයෙන් පිළිගනිමින් එකී චක්‍රලේඛයන්හි කොන්දේසි හා නියමයන්ට අනුකූලව මෙම ගිවිසුම තුළ එකඟ වන නිවාඩු කාලසීමාව තුළ කටයුතු කිරීමට දෙපාර්ශවයම එකඟ වෙයි.

2. රා.ප.ච.අංක 14/2022(I) හා එමගින් සංශෝධිත රා.ප.ච.අංක 14/2022 චක්‍රලේඛ යටතේ දෙවන පාර්ශවය විසින් විදේශ නිවාඩු අයදුම් කිරීමේදී සහ පළමු පාර්ශවය විසින් ඊට අදාළ විදේශ නිවාඩු අනුමත කිරීමේදී රා.ප.ච.අංක 14/2022(I) හා එමගින් සංශෝධිත රා.ප.ච.අංක 14/2022 චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධාන, ඊට අදාළ රජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන,බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කාර්ය පටිපාටි රීති මඟින් නියම කරන විධිවිධාන හා සමාන්තරව ක්‍රියාත්මක විය යුතු බව දෙපාර්ශවය පිළිගනියි.

3. පළමු පාර්ශවය දෙවන පාර්ශවය වෙත රා.ප.ච.අංක 14/2022 චක්‍රලේඛය යටතේ විදේශ නිවාඩු අනුමත කිරීමේදී, එම චක්‍රලේඛයෙහි 02 සහ 03 ඡේද අවස්ථාවෝචිත පරිදි අදාළ විය යුතු බවද දෙපාර්ශවය පිළිගනියි.

4. රා.ප.ව.අංක 14/2022(I) හා එමගින් සංශෝධිත රා.ප.ව.අංක 14/2022 චක්‍රලේඛ යටතේ අනුමත විදේශ නිවාඩු කාල සීමාව තුළ එම චක්‍රලේඛ උපදෙස් හා නියමයන්ට යටත්ව සෑම විටම ක්‍රියා කිරීමට දෙවන පාර්ශවය එකඟ වේ.

5. දෙවන පාර්ශවය විසින් මෙම ගිවිසුමට අදාළ විදේශ නිවාඩු කාල සීමාව තුළ රා.ප.ව.අංක14/2022(I) හා එමගින් සංශෝධිත රා.ප.ව.අංක 14/2022 චක්‍රලේඛයන්හි උපදෙස්, කොන්දේසි හෝ නියමයන් නොසලකා හරිමින් හෝ පැහැර හරිමින් හෝ කඩකරමින් කටයුතු කර ඇති බව තහවුරු වන කවර හෝ අවස්ථාවක දෙවන පාර්ශවයට අදාළ රා.ප.ව.අංක 14/2022(I) හා එමගින් සංශෝධිත රා.ප.ව.අංක 14/2022 චක්‍රලේඛ යටතේ හිමි වූ බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට අදාළ හිමිකම් සම්බන්ධයෙන් හෝ එම චක්‍රලේඛ යටතේ හිමිවූ වෙනත් කවර හෝ හිමිකමක් සඳහා තමන්ට අයිතිවාසිකමක් නොමැති බව දෙවන පාර්ශවය පිළිගනියි.

6. දෙවන පාර්ශවයට විදේශ නිවාඩු කාල සීමාව තුළ රටින් බැහැරව සිටින කාල සීමාවේදී රා.ප.ව.අංක 14/2022(I) හා එමගින් සංශෝධිත රා.ප.ව.අංක 14/2022 චක්‍රලේඛ අනුව නිවාඩු අනුමත කරන දිනට හිමි මූලික වැටුපට අදාළ වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ දායක මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමේදී ඊට අදාළ තහවුරුවක් පළමු පාර්ශවයට යොමු කිරීමට දෙවන පාර්ශවය එකඟ වන අතර, ඒ හා සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් කලින් කල ලබා දෙන උපදෙස් අනුව කටයුතු කිරීමට දෙවන පාර්ශවය එකඟ වෙයි.

ඉහත කී කොන්දේසීන්ට යටත්ව පහත නම් සඳහන් සාක්ෂිකරුවන් ඉදිරියේ ඉහත කී දෙපාර්ශවය විසින් මෙම ගිවිසුමට හා මේ හා සමාන තවත් ගිවිසුමකට වර්ෂ ............... ක් වූ ............................ මස ...........දින .......................... දී අත්සන් තබන ලදී.

**පළමු පාර්ශවය වෙනුවෙන්**

අත්සන : ..........................................
නම : ...............................................................................
ලිපිනය : ...............................................................................
ජාතික හැඳුනුම්පත් අංකය : ...............................................................
නිල මුද්‍රව

**දෙවන පාර්ශවය වෙනුවෙන්**

අත්සන : ..........................................
නම : ...............................................................................
ලිපිනය : ...............................................................................
ජාතික හැඳුනුම්පත් අංකය : ...............................................................

**සාක්ෂි :**

1. අත්සන :
   නම :
   ලිපිනය :
   ජාතික හැඳුනුම්පත් අංකය :

2. අත්සන :
   නම :
   ලිපිනය :
   ජාතික හැඳුනුම්පත් අංකය :